සමාජ සේවා, සුභසාධන සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
சமூக சேவைகள், நலன்புரி மற்றும் கால்நடை வளர்ப்பு அபிவிருத்தி அமைச்சு
Ministry of Social Services, Welfare & Livestock Development

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
# முதியோர்களுக்கான தேசிய செயலகம்
# National Secretariat for Elders

NATIONAL COUNCIL FOR ELDERS

මගේ අංකය / My No. : NSE/Dev/03 / 06/1 - i

ඔබේ අංකය / உமது இல :

දිනය / திகதி : 2015-05-19

25 MAY 2015

නාවලපිටිය

චක්‍රලේඛ අංක :- NSE/DEV/E.I.D/003

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.**

01. වැඩිහිටි හැඳුනුම්පත නිකුත් කල හැක්කේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහාය. (හැඳුනුම්පත නිකුත් කරනු ලබන දිනට වයස අවුරුදු 60 සම්පූර්ණ විය යුතුය.)
02. වයස සනාථ කරගැනීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත භාවිතා කල යුතුවේ.
03. එසේ නොවන අය සඳහා අනුමාන වයස් සහතිකයක් මත ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් නිකුත් කල හැකිවේ.
04. කිසිදු අයකිරීමකින් තොරව සියලුම ලාංකික වැඩිහිටි ප්‍රජාවට මෙම හැඳුනුම්පත ලබා දිය යුතුවේ.

**ක්‍රමවේදය,**

01. අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොනුගත කර තැබිය යුතුවේ.
02. මේ සඳහා නම ,ලිපිනය, උපන්දිනය සහ හැඳුනුම්පත නිකුත් කල දිනය ඇතුළත් ලෙජරයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යා යුතුවේ.
03. හැඳුනුම්පත් සඳහා ඡායාරූප ගැනීමේදී ඔබට ලබා දී ඇති කැමරාවම භාවිතා කල යුතුවේ.
04. ඡායාරූප ගැනීම සඳහා යොදාගන්නා පසුබිම තද රතු වර්ණයෙන් යුක්ත විය යුතුවේ. ඒ සඳහා විල්ලුද තිරයක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ලබාදෙනු ලැබේ.
05. නව ක්‍රමවේදය අනුව හැඳුනුම්පත් මුද්‍රණය කරනු ලබන්නේ පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ කාර්යාලය හෝ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පමණි. ඒ අනුව අදාල සේවාලාභියාගේ තොරතුරු හා ඡායාරූපය පරිගණක ගත කර තබාගත යුතු අතර ඡායාරූපය සමග අදාල තොරතුරු දී ඇති ආකෘතියට සකස් කර එම තොරතුරු ඔබට ළඟම පළාත් සමාජ සේවා කාර්යාලයට හෝ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ගොස් ලබා දී වැඩිහිටි හැඳුනුම්පත් මුද්‍රණය කර ගැනීම සිදුකල යුතුය.(අදාල හැඳුනුම්පත් ආකෘතිය ඉදිරියේදී ලබා දෙනු ලැබේ)

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2 மாடி, D பிரிவு, செத்சிறிபாய 2வது கட்டத் தொகுதி,பத்தரமுல்லை
Address : 2nd Floor , Block D, Sethsiripaya - II Stage, Baththaramulla
ඊ-මේල් / ஈ-மெயில் / E-mail : nsemss@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office : 0113094543/44
ෆැක්ස් / பெக்ஸ் / Fax : 0112187015

06. හැඳුනුම්පත් සඳහා අංක ලබාදීමේදී පහත පරිදි අංක ලබාදීම සිදුකල යුතුවේ. එහිදී පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා නියමිත අංක භාවිතා කල යුතුවේ. repositori.icta.lk/LIFe/navigate යන වෙබ් පිටුව භාවිතයෙන් ලබා ගත හැකිවේ.

ආදර්ශය පහත පරිදි වේ.

| |
|---|
| පළාත/දිස්ත්‍රික්කය/ප්‍රා.කා./අනුඅංකය E |
| 0/00/000/0000 |

උදා :- බස්නාහිර පළාත / ගම්පහ දිස්ත්‍රික්කය / අත්තනගල්ල ප්‍රා.ලේ.කා. / අනු අංකය E

12270001E

07. අනු අංක ලබා දීමේදී හැඳුනුම්පත නිකුත් කරන පළමු සේවාලාභියා සඳහා ඔබගේ පහසුව පරිදි 01 සිට අංක ලබා දිය හැකිය.

08. වැඩිහිටි පුරවැසියෙක් මියගිය විට හැඳුනුම්පත අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාරදිය යුතුවේ.

09. කිසියම් හැඳුනුම්පතක් නැතිවුවහොත්/අස්ථානගත වුවහොත් ඒ බව නිකුත්කල ලේඛණයේම සටහනක් යොදා ඉහත අංකයටම නැවත නිකුත් කල යුතු අතර ඒ සඳහා අදාල සේවාලාභියාගෙන් දිවුරුම් පෙත්සමක් ලබා ගත යුතුය.

10. සෑම හැඳුනුම්පත්ලාභියෙකු පිළිබඳවම විස්තර තැපැල් කාර්යාල, පොලිසිය, බැංකු, රෝහල් වෙත ලබාදිය යුතුවේ.

සුවින්ද එස්. සිංගප්පුලි

අධ්‍යක්ෂ